# ප්‍රවාහන සේවා අධිකාරිය - මධ්‍යම පළාත

# පුරප්පාඩු සඳහා බඳවා ගැනීම්

**(අන්තර් වාර බස්රථ, ධාවනය සඳහා වන උපදේශන කොන්ත්‍රාත් ව්‍යාපෘතිය)**

ලෝක බැංකු ආධාර මත මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන මහනුවර නගරයේ අන්තර් වාර බස්රථ, ධාවනය සඳහා වන උපදේශන කොන්ත්‍රාත්තු ව්‍යාපෘතියේ පවතින පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ව්‍යාපෘති නිලධාරී - තනතුරු 01

**සේවා කාණ්ඩය සහ වැටුප :** PS6 - මාසිකව (අවමය 50,000/- උපරිමය 61,000/-) සහ අනුමත දීමනාවන්

(1/ 2019 දරණ මුදල් අමාත්‍යාංශ කළමනාකරණ සේවා චක්‍රලේඛනයේ PS6 වැටුප් කේතයන් හි තුන්වන කාණ්ඩයට අදාළ වන වැටුප් තල හා නියමිත දීමනා)

**වයස :** අවු. 45 ට නොවැඩි විය යුතුයි.

**සුදුසුකම් :** බාහිර අයදුම්කරුවන් සඳහා

i. අ.පො.ස ( සා:පෙළ) විභාගය ගණිතය, සිංහල/දෙමළ, ඉංග්‍රීසි ඇතුළුව විෂයන් 04 සාමාර්ථ සහිතව විෂයන් 06ක් එකවර සමත්වීම්

**සහ**

අ.පො.ස (උ:පෙළ) විභාගය විෂයන් 03 කින් සමත්වීම (පොදු පරීක්ෂණය හැර) සමග වසර 08 ක සේවා පළපුරුද්දක් තිබීම.

**හෝ**

ii. තෘතියික හා වෘත්තීය පුහුණු ආයතනයක් මගින් අනුමත වෘත්තීය තාක්ෂණ ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ NVQ-5 මට්ටමේ නොඅඩු සහතිකයක් ලබා තිබීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක සේවා පළපුරුද්දක් තිබීම.

## 02. තාක්ෂණ නිලධාරී - තනතුරු 02

**සේවා කාණ්ඩය සහ වැටුප :** PS6 - මාසිකව (අවමය 50,000/- උපරිමය 61,000/-) සහ අනුමත දීමනාවන්

(1/2019 දරණ මුදල් අමාත්‍යාංශ කළමනාකරණ සේවා චක්‍රලේඛනයේ PS6 වැටුප් කේතයන් හි තුන්වන කාණ්ඩයට අදාළ වන වැටුප් තල හා නියමිත දීමනා)

**වයස :** අවු. 45 ට නොවැඩි විය යුතුයි.

**සුදුසුකම් :**

i. තෘතියික හා වෘත්තීය පුහුණු ආයතනයක් මගින් අනුමත වෘත්තීය තාක්ෂණ ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ NVQ 5 මට්ටමට නොඅඩු අධ්‍යාපන සුදුසුකම් හා ප්‍රවාහන ඩිජිටල්කරණයට අදාළ තාක්ෂණ භාවිතයට සමගාමී අවම වසර 03 කට නොඅඩු සේවා පළපුරුද්ද.

## 03. අභ්‍යන්තර විගණන නිලධාරී - තනතුරු 01

**සේවා කාණ්ඩය හා වැටුප :** PS6 – මාසිකව (අවමය 50,000/- උපරිමය 61,000/-) සහ අනුමත දීමනාවන්

(1/2019 දරණ මුදල් අමාත්‍යාංශ කළමනාකරණ සේවා චක්‍රලේඛනයේ PS6 වැටුප් කේතයන් හි තුන්වන කාණ්ඩයට අදාළ වන වැටුප් තල හා නියමිත දීමනා)

**වයස :** අවු. 45 ට නොවැඩි විය යුතුයි.

**සුදුසුකම් :**

i. අ.පො.ස ( සා:පෙළ) විභාගය ගණිතය/ සිංහල/දෙමළ/ ඉංග්‍රීසි ඇතුළුව විෂයන් 04 සාමාර්ථ සහිතව විෂයන් 06 ක් එකවර සමත් වීම

**සහ**

අ.පො.ස (උ.පෙළ) විභාගය විෂයන් 03 කින් සමත්වීම (පොදු පරීක්ෂණය හැර) සහ විගණන ක්ෂේත්‍රයේ වසර 03 ක සේවා පළපුරුද්ද (පරිගණක ආශ්‍රිත)

**හෝ**

ii. තෘතියික හා වෘත්තීය පුහුණු ආයතනයක් මගින් අනුමත වෘත්තීය තාක්ෂණ ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ NVQ-5 මට්ටමට නොඅඩු සහතිකයක් ලබා තිබීම සහ පරිගණක ආශ්‍රිතව විගණන ක්ෂේත්‍රයේ වසර 05 ක සේවා පළපුරුද්දක් තිබීම.

**ඉහත සඳහන් සියලු තනතුරු සඳහා අදාළ වන වෙනත් කරුණු**

- ❖ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- ❖ මෙම තනතුර ව්‍යාපෘති කාලය සඳහා පමණක් සීමාවේ. ව්‍යාපෘති කාලය මාස 15 ක් වන අතර කොන්ත්‍රාත් පදනම් මත බඳවා ගනු ලැබේ.
- ❖ සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමිවේ.
- ❖ තනතුරට අදාළව පැවරී ඇති රාජකාරි ඉටු කිරීමට සහ මහනුවර දිස්ත්‍රික්කයේ සේවය කිරීමට ශාරීරිකව හා මානසිකය තත්ත්වයෙන් සුදුසු විය යුතුය.
- ❖ අවශ්‍ය අවස්ථා වලදී රාත්‍රී කාලයේ සේවය කිරීමට හැකි විය යුතුය.
- ❖ මහනුවර නගරය ආසන්නයේ පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛත්වය හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදුවේ.

**අයදුම්පත් :** සම්පූර්ණ තොරතුරු ඇතුළත් ජීව දත්ත, අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සඳහන් කරන ලද අයදුම්පත අදාළ සහතිකවල පිටපත් සහිතව 2025.08.10 දිනට පෙර **"සාමාන්‍යාධිකාරී, මහ ප්‍රවාහන සේවා අධිකාරිය, අංක 595, දිගන පාර, කුණ්ඩසාලේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදිය හැකිය. අයදුම්පත්‍රය ඇතුළත් ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**ප්‍රවාහන සේවා අධිකාරිය, මධ්‍යම පළාත.**